කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2015

වාර්ෂික පරීක්ෂණය (2016 ඔක්තෝබර්/නොවැම්බර්)

ආර්ථික විද්‍යාව

ECON 53115/ ECON M 06 : ආර්ථික විද්‍යාව සඳහා පර්යේෂණ ක්‍රම

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. සමාජීය විද්‍යා පර්යේෂණ වර්ග පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

02. අ. පර්යේෂණයක් සැලසුම් කිරීමේදී 'පර්යේෂණ චක්‍රය' මගින් ඉටුකෙරෙන කාර්යභාරය පැහැදිලි කරන්න.

ආ. ' කල්පිතයක් ' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? පර්යේෂණ අධ්‍යයනයකදී කල්පිත ගොඩනගා ගැනීමේ වැදගත්කම පහදන්න.

03. අ. ප්‍රත්‍යක්ෂ මූල අධ්‍යයනවලදී සංගණනයට වඩා නියැදි සමීක්ෂණය වාසිදායක වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

ආ. ' නියැදි සමීක්ෂණයකදී අධ්‍යයන ගැටලුව නිශ්චිතව හඳුනාගැනීම වැදගත් වේ.' පැහැදිලි කරන්න.

ඇ. නියැදි සමීක්ෂණයකදී නියැදි රාමුවේ වැදගත්කම විස්තර කරන්න.

04. අ. ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යෝග්‍ය වන්නේ කුමන තත්ත්ව යටතේදැයි පැහැදිලි කර එම නියැදුම් ක්‍රමය භාවිතයෙන් නියැදියක් තෝරා ගන්නා ආකාරය විස්තර කරන්න.

ආ. නියැදි සමීක්ෂණයකදී 'ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා' (Focused Group Discussion) ක්‍රමයෙන් දත්ත රැස්කරන ආකාරය පැහැදිලි කරන්න. දත්ත රැස්කිරීමේ එම ක්‍රමයේ ප්‍රබලතා හා දුබලතා විස්තර කරන්න.

05. අ. සද්භාවවාදය (Ontology) සහ ඥානවිභාගය (Epistemology) යන පදවලින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කර ආර්ථික පර්යේෂණවලට ඒවායේ අදාළත්වය විස්තර කරන්න.

ආ. නිගාමී (Deductive) හා උද්ගාමී (Inductive) පර්යේෂණ ප්‍රවේශ අතර වෙනස දක්වා ආර්ථික පර්යේෂණවලදී ආර්ථික විද්‍යාඥයෝ මෙම ප්‍රවේශ භාවිත කරන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

06. අ. ප්‍රමාණාත්මක පර්යේෂණ හා ගුණාත්මක පර්යේෂණ අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් මොනවා ද?

ආ. පහත දැක්වෙන ඒවායේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

i. පුස්තකාල පර්යේෂණ
ii. ක්ෂේත්‍ර පර්යේෂණ
iii. විද්‍යාගාර පර්යේෂණ

07. i. " ක්‍රියාවෙන් ඉගෙනීම " ක්‍රියා මූල පර්යේෂණය හඳුන්වාදීමට ඇති කෙටිම නිර්වචනයයි. සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ක්‍රියා මූල පර්යේෂණ චක්‍රය (the action research cycle) සහ ක්‍රියා මූල පර්යේෂණ ක්‍රමවේදය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. මෑතදී කරන පශ්චාත් උපාධි පාඨමාලා ඇගයීම් ප්‍රතිඵල අනුව සිසුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් සඳහන් කරන ලද්දේ උපාධි පාඨමාලාව තුළ ඒ ඒ විෂයයන්වලට ලබාදුන් නිබන්ධන (assignments) මාතෘකාවලින් එකී විෂයයන්වල විෂය කරුණු අවබෝධ කර ගැනීමට අවකාශයක් නොලැබෙන බවයි. මෙම ගැටලුව විසඳීම අංක (ii) දී විස්තර කරන ලද ක්‍රමවේදය අනුව ක්‍රියා මූල පර්යේෂණයක් සැලසුම් කරන්න.

(ලකුණු 10)